People's Journal Sri Lanka
ISSN 3121-3049
Volume 01, Issue 01

# පැරණි පෙරදිග දේශපාලන න්‍යාය ධර්ම අනුරාධපුර රාජධානියේ පරිපාලනයට සිදුකළ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

ආචාර්ය ආර්. කේ. එම්. ටී. ඉන්ද්‍රාණි
indrani619v@gmail.com
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**සාර සංක්ෂේපය**

දේශපාලන සංකල්ප පිළිබඳ ව අධ්‍යයනය කරනු ලැබූ සාරධර්ම පථ සුලභය. එහෙත් එකී අධ්‍යයන දේශපාලනික සන්දර්භයට උචිත වන ආකාරයෙන් බටහිර දේශපාලන සංකල්පයන් කේන්ද්‍රාපසාරීව බිහි වූ අද්‍යයතන යුගයට සමකාලීන අධ්‍යයන වන්නේය. නූතන දේශපාලන ක්ෂේත්‍රයෙහි සංකල්පයන් බටහිර රාජ්‍යයන්ට පවරා දෙනු ලැබීම වැළැක්විය නො හැක්කේය. මෙය සර්ව සාධාරණ නියතියක් නො වන්නේය. බටහිර රාජ්‍යයන් ප්‍රමුඛ අපරදිග ලෝකය තුළ මෙන්ම පෙරදිග රාජ්‍යයන් තුළ ද ඉතා දියුණු දේශපාලනික උපක්‍රමයන්ගෙන් සමන්විත රාජ්‍ය පරිපාලන තන්ත්‍රයක් නිර්මිතව තිබූ බවට මූලාශ්‍රමය සාධක මඟින් හෙළි වන්නේය. එහෙත් බටහිර දේශපාලන සංකල්පයන් කෙරෙහි යොමු වන්නා වූ අවධාරිතාවය නිසා පෙරදිග දේශපාලන න්‍යාය ධර්මයන්හි ඓතිහාසික දැනුම් සම්භාරය නූතනයෙහි දී අධ්‍යයනය කිරීමට මෙන්ම ප්‍රායෝගිකත්වයට පත් කරලීම වැදගත්ය. එවැනි පසුබිමක් යටතේ පෙරදිග රාජ්‍යයන්හි ක්‍රියාත්මක වූ රාජ්‍ය පරිපාලන විධි ක්‍රම විමර්ශනය කරලීමේ දි වූ බලපෑම අධ්‍යයනය කිරිම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත වූ අතර ඓතිහාසික සන්සන්දනාත්මක ක්‍රමය සහ තේමා විශ්ලේෂණ ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය කර නිගමනවලට එළඹ ඇත. තත්කාල අවදිය වනවිට ශ්‍රී ලංකාවෙහි පවතින්නා වූ අකාර්යක්ෂම සහ අස්ථාවර දේශපාලන භූමිකාව සාධනීය ආකාරයෙන් ප්‍රතිනිර්මාණය කරලීම උදෙසා ද මෙකී පැරණි පෙරදිග දේශපාලන න්‍යාය ධර්මයන් භාවිතය යුක්ති යුක්ත වන බව ද මෙම අධ්‍යයනයෙන් අනාවරණය වුණි.

**ප්‍රමුඛ පද:** දේශපාලන උපක්‍රම, බටහිර සංකල්ප, ප්‍රායෝගිකත්වය, ඓතිහාසික දැනුම

**Article History: Received: 13.03.2025 Accepted: 06.07.2025**

CC BY NC ND

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

## 1. හැඳින්වීම

සමාජ සම්භවය සමඟ ම ප්‍රභවය වූ දේශපාලනික න්‍යායධර්ම ද රාජ්‍යයන්හි භූ භෞතික පිහිටීම කේන්ද්‍ර කොට ගෙන මූලික කොටස් ද්වයකට වර්ගීකරණය කළ හැකිය. එනම් ආසියානු කලාපයෙහි ඉන්දියාව කේන්ද්‍ර කර ගෙන බිහි වූ පෙරදිග දේශපාලන න්‍යායන් සහ අපරදිග යුරෝපීය රාජ්‍යයන් මුල් කර ගනිමින් බිහි වූ අපරදිග දේශපාලන න්‍යාය ධර්ම වශයෙනි.

මෙම මූලික න්‍යායධර්ම වර්ග දෙකෙහි ම මුඛ්‍යාර්ථය විධිමත් පරිපාලන තන්ත්‍රයක් බිහි කොට සමාජ ස්ථාවරත්වය නිර්මාණය කරලීම වේ. නමුදු එකී අපේක්ෂා සාධනය උදෙසා මේකී පෙර අපර දෙදිග රාජ්‍යයන් ක්‍රියාත්මක කරනු ලබන දේශපාලනමය න්‍යායධර්ම පරස්පර විරෝධී වන අවස්ථාවන් කොතෙකුදු අනාවරණය වේ.

රාජ්‍යත්වයෙහි ප්‍රභවය බලතල, කාර්ය සාඵල්‍යය, පරිපාලන තන්ත්‍රය හා සම්බන්ධිත ආයතනික සන්දර්භයන් නිලධරයින්, අධිකරණමය හා යුධමය සංවිධානය, බදුකරණය වැනි ආර්ථික ක්ෂේත්‍රයන්හි ව්‍යුහය ද එකී රාජ්‍යයහි සංස්කෘතියට ආවේණික පරිපාලන සිරිත් විරිත් ආදි සමස්තය වනාහි දේශපාලන න්‍යය ධර්ම යන්නට අයත් අංශ වේ.

පෙරදිග රාජ්‍යයක් වන ශ්‍රී ලංකාවෙහි අනුරාධපුර යුගය තුළ පූර්වෝක්ත ක්ෂෙත්‍ර අධ්‍යයනය ඔස්සේ පැරණි පෙරදිග රාජ්‍යයන්හි භාවිත දේශපාලන න්‍යාය ධර්ම කෙතෙක් දුරට සමපාත වූයේ ද යන්න ප්‍රමාණය කරලීම මෙම අධ්‍යයනයෙන් සිදු වේ.

### 1.1 රාජ්‍යත්වයේ ප්‍රභවය තදනුබද්ධිත චාරිත්‍ර වාරිත්‍ර සහ මධ්‍ය පරිපාලනය

පූර්ව රාජ්‍ය අවධියේ සිට ම ශ්‍රී ලංකාවේ පාලක පිරිස් ගාමණී, අභය වැනි විරුද නාම භාවිත කිරීමේ එක් අරුතක් වනුයේ ඔවුන්ගේ යුධ නායකත්වය හෙළිදරව් වීම බව හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි (Hettiarchchi 1972: 8-21). මුල් ජනාවාසවල රණවිරු අධිපතියෙකුගේ තත්ත්වයේ සිට ක්‍රමයෙන් විකාශනය වී රාජ්‍යත්වයට පත් ව එය බොහෝ දුරට වර්ධනය විමෙන් පසුව වුව ද මුල්දී මූලික වශයෙන් සංග්‍රාමික සංවිධානයක තත්ත්වය පිළිඹිඹු කළ ගාමිණී යන පදය තව දුරටත් රාජකීය විරුදයක් ලෙස භාවිතයට ගෙන ඇත්තේ රජු යුධ සෙත්පතියෙක් යන සංකල්පය රජුට කීර්තියක් එක් කළ නිසා විය හැකිය. දේවානම්පියතිස්ස රජුගේ අභිෂේක මංගල්‍යය ප්‍රාදේශීය යුද්ධාධිපතියෙකුගේ තත්ත්වයේ සිට රාජ්‍යත්වයේ සකලාංගයන්ගෙන් සමන්විත පිරිපුන් රජෙකුගේ තත්ත්වය දක්වා විකාශනය වීමේ අවස්ථාව හා සම්බන්ධ ඉතාම වැදගත් සන්ධිස්ථානයකි.

කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය, ශුක්‍ර නීතිසාරය සහ මනුධර්ම ශාස්ත්‍රය යනාදී ග්‍රන්ථයන්වල විශ්වයේ ආරක්ෂාව සඳහා බියෙන් පසුවන ජනයා බියෙන් මුදවාලීම

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

සඳහා ඊශ්වරයා විසින් රජු නිර්මාණය කළ යැයි පවතින්නා වූ විශ්වාසය අනුරාධපුර යුගයහි පමණක් නොව මහනුවර යුගය දක්වාම පැවති බවට මහාචාර්ය පරණවිතාන පෙන්වා දෙයි. එය කෙතෙක් දුරට ස්ථාපිත වූයේ ද යත් තිස්ස රජතුමා දෙවනපිය අභිධානය භාවිත කරලීමේ පටන් දශක තුන හමාරක් පමණ වන තෙක් මෙම විරුදාවලිය රජුන් භාවිත කරලීමෙන් පෙනී යයි.

1. දෙවනපිය මහරඣ ගමණි අබයශ පුත (Epigraphia Zeylanica 1955: Vol.V, 209).
2. සිධම් දෙවනපිය තිස මහරඣහ (Epigraphia Zeylanica 1912: Vol.I, 144).
3. දෙවනපිය තිස අ(බය)හ ලෙණෙ (Mendis 1945: 79).

පෙරදිග රාජ්‍යයවල ප්‍රමුඛතම දේශපාලන න්‍යායක් වන රජවරුන් මිනිසුන් වශයෙන් පෙනි සිටිය ද දෙවිවරුන් වශයෙන් සැලකිය යුතුය යන මේකී සංකල්පය හින්දු ආගමෙහි බලපෑමේ ප්‍රතිඵලයක් වන බවත් ආචාර්ය මෙන්දිස්ගේ මතය වේ.

පසුකාලීනව ලක්දිව රජුන් දෙවියන් වශයෙන් නො ගැනුන ද ඔවුන් තව දුරටත් හුදු මිනිසුන් වශයෙන් ද නොසැලකිණි. වට්ටගාමිණි අභය රජු පිතිරාජ විරුදනාමය භාවිත කළේ තමා යම රජු හා සමාන බව හැඟවීමටයි. දුටුගැමුණු රජුගේ භෂ්මාවශේෂ දක්ඛිණ ථූපයේ නිධන් කළේය. සිරිසඟබෝ රජු ආදාහනය කළ ස්ථානයේ පසුකාලීනව විහාරයක් ඉදි කළේය. මහාසෙන් රජු මින්නේරි දෙවියන් ලෙස පිදුම් ලැබීම මෙන් ම ගජබාහු රජු දේවත්වයෙන් සැලකීම ජනතාව විසින් සිදු විය. මේ අනුව පසුකාලීන රජවරුන් පත් වූ ඉහළම තත්ත්වය දේවත්වය ලෙස හඳුනා ගත හැකිය.

ක්‍රි.ව. 4 වන සියවසෙහි සිට ක්‍රි.ව. 11 වන සියවස දක්වා වූ කාලවකවානුව තුළ දි රාජ්‍යත්වය පිළිබඳ ලංකාවේ පූර්වයේ පැවති මතිමතාන්තර වෙනස් විය (Mendis 1945: 79). මේ වකවානුවේ සිට රජවරුන් සාමාන්‍ය මිනිසුන් වශයෙන් නොව බෝධිසත්ත්වයින් ලෙස සැලකූ බව ගම්‍යමානිත වේ. සෞභාග්‍යයෙන් හෙබි ලංකාවේ රාජ්‍ය පදවිප්‍රාප්ත විය යුත්තේ බෝධිසත්ත්වවරයෙක් ම බව සිවුවන මහින්ද රජුගේ ජේතවනාරාම ටැම් ලිපිය සනාථ කරයි.

People's Journal Sri Lanka
ISSN 3121-3049
Volume 01, Issue 01

ලක්හි නොබොහොසත්හු නොරජ්වන්හය

සැහැකුල කොත් සවැනිය මුනි රජ්හු

(වියරණ) ලක් තුමා පස් සිවුර රකිනු වස්

මග සග්හු පිළිවැයු රජ්සිරි පැමිණැ සැන (Epigraphia Zeylanica 1928 : Vol.II, 158).

රාජ්‍ය උරුමය පිළිබඳ නෛතික තත්ත්වය ද රාජ්‍යත්වය සම්බන්ධයෙන් වැදගත් වේ. ඉන්දියාවේ වේද කාල සමයේ දී මෙන්ම ලංකාවේ ද රාජ්‍යත්වය සාමාන්‍යයෙන් පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ බව දැකිය හැකිය. නමුත් බල ලෝබය කරණ කොටගෙන නීත්‍යානුකූල උරුමකරුවෝ නෙරපා හෝ ඝාතනය කොට රාජ්‍ය බලය පැහැරගත් අවස්ථාවන් ද දිස්වේ. රාජ්‍ය පැහැරගනු ලැබූ මෙවැනි අවස්ථා හැරුණු විට සාමාන්‍යයෙන් පැරණි ලංකාවේ රාජ්‍යත්වය පිය පුත් උරුමය සහ ජ්‍යේෂ්ඨත්වය අනුව පරම්පරානුකූලව පැවත ආ බව පෙනේ.

ක්‍රි.ව. 797 රජ පැමිණි තුන්වන මහින්ද රාජ්‍ය සමයේ සිට ක්‍රි.ව. 956 රජ පැමිණි සිවුවන මහින්ද රාජ්‍ය කාල සීමාව නිදර්ශන කොට ගෙන විල්හෙල්ම් ගයිගර් ප්‍රකාශ කරනුයේ ලංකාවේ රජකම ජ්‍යේෂ්ඨත්වය අනුව සහෝදරයාගෙන් සහෝදරයාට උරුම වූ බවයි. එනම් පුත්‍රයාට රාජ්‍යත්වය උරුම වූයේ සහෝදරයෙක් නොමැති වුවහොත් ද මෙය ජ්‍යේෂ්ඨ සහෝදරයාගෙන් ජ්‍යේෂ්ඨ පුත්‍රයාටත් ඔහුගෙන් පසුව ඔහුගේ සහෝදරයන්ටත් ආදී වශයෙන් උරුම වූ බව වැඩි දුරටත් පැහැදිලි කරනු ලැබේ.

එපමණක් නොව දෙවැනි දප්පුල සහ දෙවැනි සේන ආදී රාජ්‍ය ප්‍රාප්තික කාල සීමාවන්හි ද ලක්දිව පූර්වයේ පැවති පිය පුත් උරුමය යටපත් වී සොහොයුරු උරුමය මතු වූ අයුරු දිස් වන්නට විය. පූර්වෝක්ත නිදර්ශන අනුසාරයෙන් එවැනි රීතියක් ලක්දිව නියත වශයෙන්ම පැවති බවක් නිගමනය කළ නො හැකිය.

ඉන්දියාවේ ද නිශ්චිතව සමස්ත රාජ්‍යයන්හි ම බල පැවැත්වූයේ පිය පුත් උරුමයයි. පුරාණ ඉන්දියාවේ රාජ්‍ය පාලනය නැමති ග්‍රන්ථයේ එන්. එල්. ලෝ ප්‍රකාශ කරනුයේ රජෙකුගේ ඇවෑමෙන් ඒ රජුගේ වැඩිමහල් පුත්‍රයා රජකමට තෝරා ගැනීම පෙර පටන් පැවති සාමාන්‍ය රීතියක් බවයි. පුරාණ කාලවලදි මාරුවෙන් මාරුවට සොහොයුරන් රජ කිරීම චන්ද්‍ර හෝ සූර්යවංශ යන පෙළපත් එකකවත් නො ආ විරු දෙයකි (Law 1921 :51,54). පුරාණ ලංකාවෙහි ද රාජ්‍ය උරුමය මෙයට සමාන ආකාරයකින් පැවති බවට මහාවංශය ආශ්‍රයෙන් ගෙනහැර දැක්වීම උචිත වේ.

දේවානම්පියතිස්ස රජුගෙන් පසුව පුත් කුමරෙක් නොවූ බැවින් සොහොයුරු උත්තිය රජ පැමිණි බව දැක්වේ. පසුකාලීනව රජ පැමිණි දුටුගැමුණු රජුගේ ඇවෑමෙන් ඔහුගේ සොහොයුරු සද්ධාතිස්ස කුමරු රජ පැමිණි බව මහාවංශයේ සඳහන් වනුයේ මෙලෙසෙනි.

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

අසෝකමාලා කෙරෙහි තදින්ම පිළිබඳ සිත් ඇති වූ නිසා රජකම ඔහු කිසිඳු අගයක් කොට නො සැලකුවේය. එබැවින් දුටුගැමුණු රජු ඇවෑමෙන් ඔහුගේ සහෝදර සද්ධාතිස්ස කුමරු අභිෂේකය ලැබුවේය (මහාවංසය 2020: 139).

ශ්‍රී ලාංකේය සාහිත්‍යයෙන් ද පිය පුත් උරුමය පිළිබඳ විනා අන් රාජ්‍ය උරුමයක් පිළිබඳ ව නම් කිසි විටෙක විද්‍යමාන නොවන්නේ යැයි මහාචාර්ය එම්. බී. ආරියපාල ඉදිරිපත් කළ මතය යුක්ති සහගතය.

පැරණි ඉන්දියානු රාජ්‍යත්ව උරුමය පිළිබඳව පී. සී. ධර්මා විසින් දක්වන ලද අදහස් ලංකාවේ පැවති තත්ත්වය ද මනාව ස්ඵුට කරයි. එහෙත් ඔහු ගුණ ධර්මයන්ගෙන් හෙබි ඉගෙනීම අතින් ද සුදුස්සෙක් විය යුතුය. නැතහොත් ඔහුට රාජ්‍ය හිමි නො වේ. වැඩිමහල් පුත්‍රයා රාජ්‍යයට සුදුස්සෙක් වුවද රජකමට පත් වීමට නම් මහජන කැමැත්ත හා අනුමැතිය අවශ්‍ය විය (Dharma 1941: 15).

එහෙත් උරුමය මත ම කුමාරයෙක්ට සිංහාසනය හිමි නො වුනු අවස්ථා පිළිබඳ නිදසුන් ඉදිරිපත් කළ හැකිය. රජකමට පත්කර ගැනීමට පූර්වයෙන් ඇමතිවරුන් විසින් උරුමකරුව ඉතා ප්‍රවේශමෙන් පරික්ෂා කරනු ලැබේ. ඉදින් ඔහු අභිෂේක වනුයේ රාජ්‍යභාරය ඉසිලීමට සුදුසුයැයි ඔවුන්ට වැටහුනොත් පමණි. ථුල්ලත්ථන රජු රජකමට තෝරා පත් කර ගත් සැටි මහාවංශයෙහි සඳහන් වේ.

> ''සැදැහැතිස් මහ රජු මළ කළ සියලු ඇමතියෝ ථූපාරාම විහාරයේ රැස්ව සියලු භික්ෂු සංඝයා රැස්කොට සංඝයාගේ ද අනුමැතිය ලබා ගෙන ථුල්ලත්ථන කුමරු අභිෂේක කළහ'' (මහාවංසය 2020: 139).

මෙය ජ්‍යෙෂ්ඨ පුත්‍ර ලඤ්ජිතිස්ස කුමරු රජකමට නුසුදුසු යැයි ඇමතියන් සහ මහා සංඝයා විසින් සලකන ලද හෙයින් කණිෂ්ඨ පුත්‍රයා රාජ්‍යත්වයට පත් කර ගත් අවස්ථාවකි. වංසත්ථප්පකාසිනියට අනුව සද්ධාතිස්ස රජු සිය ජ්‍යෙෂ්ඨ සොහොයුරු වූ දුටුගැමුණු රජු ඇවෑමෙන් රාජ්‍ය භාර ගැනීමට දීඝවාපියෙහි සිට පැමිණෙන විට ඔහුත් සමඟ පැමිණියේ ථුල්ලත්ථන කුමරු පමණි (වංසත්තප්පකාසානිය 1994: 488). මෙම කුමරු පිය රජුගේ සියලු ජාතික සහ ආගමික කාර්යයන්ට සහභාගී වෙමින් අනුරාධපුරයෙහි ම කාලය ගතකිරිම නිසා අමාත්‍යවරු, භික්ෂූන් වහන්සේලා මෙන්ම රටවැසියා අතර ද ඔහු කෙරෙහි අධික පක්ෂපාතීත්වයක් ගොඩ නැඟි තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය.

රාජ්‍යත්වයට පත්වීමට නම් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පූර්වයෙන් අවබෝධයක් ලබා තිබීම ද සුදුසුකමක් වූ බව ක්‍රි. පූ. තෙවන සියවසයේ සිට ක්‍රි. ව. 10 වන සියවස තෙක් ප්‍රාදේශීය පාලන ඒකකවල පරිපාලකයන් වශයෙන් පත් වූ ඇපා මාපා ආදී තනතුරුවලට (ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1964: 1 කාණ්ඩය, 351) රාජ්‍යයට උරුමකම් ඇති කුමාරවරුන් ම පමණක් පත් කරලීමෙන් පැහැදිලි වේ.

People's Journal Sri Lanka
ISSN 3121-3049
Volume 01, Issue 01

පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය ලබා ගැනීමට නම් රජු සරණ පාවා ගත යුත්තේ ස්වකීය වංශයට ගැළපෙන නැතහොත් සහලේ ඥාතියෙකි. ලාංකීය රාජ්‍යත්වය උරුම වනුයේ සිංහල රජ පරපුරට අයත් කුමරියකගේ කුසින් උපන් කුමරෙක් හට පමණැයි පිළිගත් සම්ප්‍රදායක් පැවතිම එයට හේතුවයි.

කෙසේ වෙතත් පූර්වෝක්ත සුදුසුකම් සපුරාලු පුද්ගලයාගේ රාජ්‍යත්වය නීත්‍යානුකූලභාවයට පත් කර ගැනීමට අභිෂේක වීම අත්‍යවශ්‍ය විය. දෙවනපෑතිස් රජු සමයේ ලංකාවට සම්ප්‍රදානය කළ මෞර්යය අභිෂේක ක්‍රමය ලංකාවේ රාජ්‍යත්වයේ සංවර්ධනය වැදගත් සන්ධිස්ථානයකි. ප්‍රාදේශීය නායකත්වයක සිට වඩාත් ස්ථාවර වූත් චාරිත්‍රානුකූලවත් බෞද්ධාගමික ආභාසය මත රාජ්‍යයත්වය දිවයිනේ මුල්බැස ගත් බව මූලාශ්‍රවලින් පැහැදිලි වේ (සුරවීර 1965: 07).

පළමුවන මහින්ද රජතුමා කිසිවිටෙක තම අභිෂේක උත්සවය පවත්වා නොමැති වීම (මහාවංසය 2020: 212) විශේෂත්වයකි. එබැවින් ඔහු රජ යන නාමය නො පිළිගනිමින් සිය රාජ්‍ය කාලය මුළුල්ලේ ම ආදිපාද යන නාමය භාවිත කරමින් රාජ්‍ය විචාළේය.

රද වැ මිණිවුට්නෙන් පැහැයු සිය මුත් ද්නෙත් ලොඋතුරු බිසෙව්නෙන් බිසෙස් වැ යනුවෙන් රජව මිණි ඔවු නෙත් ශෝභාවත් වූ ගිය ලෝකාධිපත්‍යයෙන් අභිෂේක කළ බවත් සඳහන් වේ (Epigraphia Zeylanica 1928: vol.II, 66).

අභිෂේක වීමෙන් පසු ඔවුන් එතෙක් භාවිත කළ පෞද්ගලික නාමයන් වෙනස් කිරීමක්ක් ද දැක ගැනීමට හැකිය. අද්‍යතනයේ මෙන්ම පුරාණයේ ද රාජ්‍ය පාලකයා යහපත් මානසික හා කායික තත්ත්වයකින් යුක්ත වීම අනිවාර්ය විය. අංගවිකල කුමාරයෙක්ට සිහසුන පවරාදීම චාරිත්‍රයට පටහැණි බව අවධාරණය කෙරුණු කථා පුවතක් ද සම්මෝහවිනෝදනී නම් විභංගට්ඨ කථාවේ ද සඳහන් වේ (සම්මෝහවිනෝදනී විභංගට්ඨ කථාව 2012: 443).

පළමුවැනි විජයබාහු රජුගේ (ක්‍රි.ව. 1055 ක්‍රි.ව. 1110) පියා වන මොග්ගල්ලාන මහා සාමි ද ඇමතිවරුන් ඉල්ලීම් කරන අවස්ථාවේ පවා රජකම නොපැතුවේ එක් ඇසක් නොමැති වූ පුද්ගලයෙකු බව පවසමිනි. අංගවිකල වූ මට දැන් රජයෙන් කවර වැඩෙක් ද මම පැවිදි බවට පැමිණ තපස්කම් කරන්නෙමි (මහාවංසය 2020: 252).

පැරණි පෙරදිග රාජ්‍ය සියල්ලෙහි ම පැවති දේශපාලනික බලාධිකාරිය ඒකාධිපති, අත්තනෝමතික, ප්‍රජා පීඩක පාලන ස්වරූපයක් නො වීය. මෙලෙස ජනහිතවාදී පාලන රාමුවක් නිර්මාණය වීම උදෙසා ආගම, පෙර සිරිත, අමාත්‍යවරුන්ගේ බලපෑම් ප්‍රබල දායකත්වයක් සැපයූ බව අනුරාධපුර යුගයෙහි ඓතිහාසික මූලාශ්‍ර පිරික්සීමෙන් සපථ වේ.

පූර්ණ බලතල සහිත අතීත රජතුමා තම මතයට අනුව ක්‍රියා කළ ඇතැම් අවස්ථාවන්හි දී එය ජන සමාජයට අහිතක් වූවා නම් රටේ ජනතාව එයට එරෙහිව නැගී සිටියහ. මහසෙන් රජතුමා ඉන්දීය භික්ෂුවක් වූ සංඝමිත්‍ර භික්ෂුවගේ මතයට

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

ඇහුම්කන් දී මහා විහාරය විනාශ කිරිමට කටයුතු කිරීමේ දී ප්‍රථමයෙන් ම ඊට එරෙහි වූයේ රජුගේ ම සේනාධිපතිවරයා වූ මේඝවර්ණාභයයි.

සම්මත නීති රීතිවලට පටහැනිව ක්‍රියා කළ රජුන්ට විරුද්ධව මහජන අප්‍රසාදය කෙතරම් ප්‍රබල වූයේ ද යත් තුන්වන උදය රජුගේ තපෝවනය පරිශුද්ධිය පිළිබඳ නො තකා ක්‍රියා කිරීම නිසා හටගත් සිදුවීම පෙන්වා දිය හැකිය.

නීති පැනවීම, නීති ක්‍රියාත්මක කිරීම, නීති උල්ලංඝනය කළවුන්ට දඬුවම් පැනවීම, මරණ දඬුවම ක්‍රියාත්මක කිරිම, විදේශ සබඳතා පැවැත්වීම, රටේ සහ රටවැසියාගේ ආරක්ෂාව සලසා දීම, වැව් තැනීම, කෘෂිකාර්මික ප්‍රදේශ දියුණු කිරීම වැනි සංවර්ධනාත්මක කටයුතු ඉටු කිරිම, ලෝකශාසන අභිවෘද්ධිය සඳහා කටයුතු කිරිම, පැරැණි සිරිත් විරිත් ආරක්ෂා කිරීම වැනි වගකීම් හා යුතුකම් රජුගෙන් ඉටු විය යුතුය.

### 2. රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ නිලධාරි පැළැන්තිය

රජතුමා රාජ්‍යයේ ප්‍රධානියා වුව ද බලතල සියල්ල රජු සතු වුව ද අත්තනෝමතික ලෙස රාජ්‍ය පාලනය නො කළහ. ඈපා මාපා මෙන්ම අමාත්‍ය මණ්ඩලයක් ද පත් කරගනිමින් එකී සහයෝගය ද ඇතිව රාජ්‍ය පාලනය කර ඇත. රාජ්‍ය පරිපාලන නිලධාරින් අතරින් ඈපා, මාපා, අග්‍ර අමාත්‍යවරයා, මෙයික්කප්පාර් සහ සේනාධිපති ප්‍රමුඛ වුව ද ඔවුන්ගේ කටයුතු පහසු කිරීමේ අරමුණින් පිහිටවනු ලැබූ පාලක මඬුල්ලක් ද විය.

- ❖ රාජකාරිය සඳහා යන රජ වාසල හා සමීප සම්බන්ධයක් ඇති මණ්ඩලය
- ❖ අධිකරණ කටයුතු භාර මණ්ඩලය
- ❖ අයබදු එකතු කළ මණ්ඩලය
- ❖ ගම් පාලක මණ්ඩලය
- ❖ යුධ කටයුතු භාර මණ්ඩලය
- ❖ ආගමික කටයුතු භාර මණ්ඩලය

පුරෝහිත තනතුර ඇතැම් විට වංසකථාවල සඳහන් වුව ද අභිලේඛනයන් හි ඒ පිළිබඳව සඳහන් නො වේ. එසේ වුව ද අනුරාධපුර යුගයේ මුල් කාලීන අභිලේඛනවල බ්‍රාහ්මණයින් පිළිබඳව අඩංගු වීම විශේෂිතය. මෙම බ්‍රාහ්මණ පිරිසට භාරතීය රාජ සභාවල මෙන් ප්‍රමුඛස්ථානයක් හිමි නො විණි. එහෙත් අනුරාධපුර යුගයේ මුල් කාලීනව මොවුන්ට බලතල සහිත මහාමාත්‍ය ධූරය හිමිව තිබූ බව වේවැල්තැන්න ලිපියේ සඳහන්ව ඇත.

මහ මත බම දත පුරුමක

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

පු (ස) ගුතෙ කරිත බද තුබ ( *Epigraphia Zeylanica* 1912: Vol.I, 135).

එබැවින් පුරාණ භාරතීය පුරෝහිතයන්ගේ ඇතැම් කාර්යයන් මෙන් ම අද්‍යතන අග්‍රාමාත්‍ය තනතුරට සමාන වූ බලතල සහ වරප්‍රසාද එකල මහාමාත්‍ය තනතුරට හිමි ව තිබූ බැව් උපකල්පනය කළ හැකිය.

රජුට පසුව පුළුල් බලතල ප්‍රමාණයක් සංකේන්ද්‍රගතව පැවති තනතුර වූයේ  සමස්ත යුධ හමුදාවෙහි ම ප්‍රධානත්වය හිමි වූ සේනාධිපති තනතුරය. අභිලේඛනවලට අනුව රාජ්‍යයක අභ්‍යන්ත්තර පාලනයත්, බාහිර ආක්‍රමණවලින් රට මුදවාගැනීම සහ රාජ්‍යයේ සාමය රැකීමත් යන කාර්යයන් ප්‍රධාන වශයෙන් මෙම නිලධාරියා සතු විය.

රාජ්‍ය පාලන පහසුව සඳහා මන්ත්‍රීන් හා ඇමතිවරුන් පත්කළ බව බිම්බිසාර අශෝක ආදී රජවරුන්ගේ පාලන ව්‍යුහ සලකා බැලීමෙන් පෙනේග රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් සෑම වැදගත් කටයුත්තක් ම මැති ඇමතිවරුන් විසින් කරන ලද අතර ඔවුන්ට විශේෂ කාර්යභාරයක් වෙන්කොට (මහාවංසය 2020: 161- 162) තිබූ බවක් නො පෙනේ. මනුස්මෘතියේ ද ඇත්තේ මෙවන් අදහසකි. මුතුන්මිත්තන්ගේ රාජ්‍ය සේවයෙහි යෙදී සිටියා වූ ද, ධර්ම ශාස්ත්‍රාදී ශ්‍රාස්ත්‍ර දන්නා වූ ද, අවි හරඹයෙහි දක්ෂ වූ ද කුලීන පවුල්වලින් පැවත එන්නා වූ ද, සුපරීක්ෂාකාරී වූ ද, අමාත්‍යවරුන් සත් දෙනෙකු හෝ අට දෙනෙකු පත්කර ගත යුතුය යනුවෙනි.

අමාත්‍යකාර්ය වනුයේ උපදේශකත්වයයි. රජුගේ පාලන කාර්යයට සහාය වීම හා ඔහුට අතපසුවන දෑ සිහි කරවීම මොවුන්ගේ වගකීමයි. රජු යමක් ක්‍රියාත්මක කිරීමට පෙර එම යෝජනා මන්ත්‍රි මණ්ඩලයට ඉදිරිපත් කළයුතු බව කෞටිල්‍යගේ අදහසයි. රාජ්‍යයේ කටයුතුවල උවදුරක් පැමිණි විට රජු මන්ත්‍රින් හා මන්ත්‍රී මණ්ඩලය කැඳවා ඔවුන්ගෙන් ඒ විෂය පිළිබඳ විමසිය යුතුය. ඔවුන් අතර වැඩි ඇමතිවරුන් සංඛ්‍යාවක් යමක් කියත් ද යම් කාර්යයක් සිද්ධ කරන උපායන් වෙයි ද රජු එය ක්‍රියාත්මක කළ යුතුය.

රාජ්‍යයක හමුදාව විශ්වාසවන්ත ප්‍රධානීන් යටතේ තැබිය යුතුය. නො එසේ නම් ඔවුන් සංවිධානාත්මක ව රාජ්‍ය බලය පෙරළීමට කටයුතු කරන බව කෞටිල්‍යගේ ප්‍රමුඛ පෙරදිග දේශපාලන න්‍යායාචාර්යවරුන්ගේ මතයකි. මෙකී න්‍යාය අනුරාධපුර යුගයේ ද එලෙසින්ම ක්‍රියාත්මක වූ ආකාරය උපතිස්ස, ධාතුසේන, හයවන අග්ගබෝධි සහ සිවුවන කාශ්‍යප ආදී රජවරු තම සේනාධිපති ධූරයට තමාට සමීපම ඥාතින් පත් කරලීමෙන් පැහැදිලි කර ගත හැකිය (මහාවංසය 2020: 176).

බඩගරික (Inscriptions of Ceylon 1970: 1192) පිළිබඳව අනුරාධපුර යුගයේ මුල් කාලයේ සිට අවසාන කාලය තෙක් ම අභිලේඛනවල සඳහන්වන නිලධාරි නාමයකි. බඩගරික යනු රජයේ භාණ්ඩාගාරය භාරව සිටි පුද්ගලයාය. පැරණි සෙල්ලිපිවලට අනුව භාණ්ඩාගාරිකයන් කිහිපදෙනෙකු පරුමක නැමති කුලීන කුලයට අයත් වූ අතර

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

අනෙක් භාණ්ඩාගාරිකවරු ගමිකයෝ වූහ (Inscription of Ceylon: 1970: 21). ක්‍රි. පූ. යුගයට අයත් ලෙන් ලිපියකට අනුව පරුමක සුමන නම් වට්ටගාමිණි අභය රජුගේ භාණ්ඩාගාරිකයෙකු ගැන සිතුල්පව්වෙන් ලැබුණු ලිපියක සඳහන් වේ (Inscriptions of Ceylon 1970: 621). මෙම රජුගේ ම තවත් භාණ්ඩාගාරිකයෙකු වූ සංඝ අමාත්‍යවරයෙකු ගැන සහස්සවත්ථුප්පකරණයේ සඳහන් වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ රාගල විහාරයේ ඇති ලෙන් ලිපියක රජෙකුගේ භාණ්ඩාගාරික තනතුර දැරුවෙකු හඳුන්වා ඇත්තේ අමතය බඩගරික අහලි යනුවෙනි. මෙවැනි නිලධාරින් පිළිබඳව සිතුල්පව්වල නුවරනක්ද, රිටිගල, මිහින්තලය සහ කන්දේගම කන්ද යනාදී ශිලා ලේඛනවලින් අනාවරණය වේ. රජුගේ භාණ්ඩාගාරිකයා පමණක් නොව පළාත් පාලන මණ්ඩලවල භාණ්ඩාගාරිකයන් ද සිටි බව පැරණි ලේඛනවල සඳහන් වේ.

ගණක යන තනතුර සඳහා සෙට්ඨි යන උපාධි නාමය අශෝක රජු විසින් ලබා දෙන ලදී. ඒ අනුව ගණකාධිකාර තනතුර රාජ්‍ය පාලනයේ දී වැදගත් තනතුරක් විය. පළමුවන ගජබාහු රජුගේ කාලයට අයත් සෙල්ලිපියක නගර ගණකයෙකු ගැන සඳහන් වේ. දෙවනපෑතිස් රජුගේ ගණකයාට අශෝක රජු විසින් පිරිනමන ලද උපාධිය වනාහි බැංකුවක හෝ වෙළෙඳ ශ්‍රේණියක හෝ ප්‍රධානියෙකුට විශේෂ වූ නාමයකි.

රාජ්‍යය පාලනය ක්‍රමවත්ව ගොඩනැගීම සඳහා රජු වටා ඒකරාශි වූ නිලධාරි මඩුල්ලක් සිටීම වැදගත් වේ. දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික යනාදී ක්ෂේත්‍ර ක්‍රමවත්ව සංවිධානය කිරිම සඳහා ඒ ඒ ක්ෂේත්‍ර භාර අධ්‍යක්ෂකවරයෙක් සිටියේය. අභිලේඛනවල මොවුන් හඳුන්වා ඇත්තේ අදෙක යන නාමයෙනි.

පකර අදෙක ඊට එක් නිදසුනකි (Archaeologocal Survey of Ceylon Inscription 1998: 77). මේ අනුව මාර්ගාධිකාරි නිලධාරියෙකු (Epigraphia Zelanica 1955: Vol. V, 226) හා ඊට පහත් නිලධාරි මඩුල්ලක් විසින් මහා මාර්ග සේවාව පවත්වා ගෙන ගොස් ඇති බව අනාවරණය වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරුලෙන සෙල්ලිපියේ සිවිකා අධ්‍යක්ෂකවරයෙකු ගැන සඳහන් වේ.

මහරජස ගාමිණි - අබයස සිවිකා - අදෙක පරුමක -මජිමස ලෙනේ අගත අනගත චතුදිස සගස අශ්වාධ්‍යක්ෂක තනතුර පිළිබඳ පෙරියපුලියන්කුලම් ලිපියකින් අනාවරණය වේ. පරුමක අස අදෙක වෙලුස ජය තිසය ලෙනෙ මීට අමතර ව දෝවාරික, නගර ගුත්තික, අමාත්‍ය, රටික, ගමික නමින් හැඳින් වූ රජුගේ සිට පහළ ක්ෂේත්‍රය දක්වා ගලා ගිය නිලධාරීහු ගණනාවක් ලක්දිව දේශපාලන ක්‍රමය තුළ ක්‍රමයෙන් ගොඩනැගුණහ. මේ තනතුරු සහිත දේශපාලන ක්‍රමවේදය සකස්වීමට ප්‍රබල ලෙස බලපෑවේ ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍යයා ලංකා දේශපාලනයට කළ මැදිහත්වීමයි.

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

සියලුම මූලාශ්‍ර සාධක සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ දේවානම්පියතිස්ස රජු සමයේ ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයාගේ අනුග්‍රහය හරහා ගොඩනැගුණු මෙරට රජ පදවිය ලැබීමේ ක්‍රමවේදය හා දේශපාලනික තනතුරු හා ඒ ආශ්‍රිතව ගොඩනැගුණු පරිපාලන රටාව පැරණි ලක්දිව දේශපාලන ගමන් මග නව දිසාවකට යොමු කළ බවයි.




අනුරාධපුර රාජධානියේ ආරම්භයේ සිට ම ශ්‍රී ලංකාව රජරට හා රෝහණය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා තිබිණි. රාජ්‍යයකට අයත් විශාල ප්‍රදේශ පස්ස, දේස, ජනපද ආදී නම්වලින් හැඳින්වීම ක්‍රි.ව. හත් වන සියවස පමණ වන තෙක් පැවතී ඇත. ප්‍රදේශ නායකයෝ රටිකල රටිය යන නම්වලින් හඳුන්වා ඇති මෙම තනතුර අනුරාධපුර යුගයේ අවසාන භාගය වනවිට රට්ලද් (Epigraphia Zelanica 1912: Vol. I. 167) ලෙස හඳුන්වා තිබේ. ඔවුන් අතරින් එක් අයෙකු පාලනය කළ උපකොට්ඨාසයක් රාජීල බීජ සහ අතන යන නම් වලින් හඳුන්වා තිබේ.

පස්ලදු (Epigraphia Zelanica 1928: Vol.II, 23) යන්න ද තවත් නිල නාමයකිග වංසකථාගත තොරතුරු විමසීමෙන් පෙනී යන්නේ රජු විසින් පාලනය කරන ලද ප්‍රදේශ දිසා හතරකට බෙදා ඇති බවයි. ඒවා පස්ස හෙවත් පළාත් නමින් හැඳින්විණ. උත්තර පස්ස, පැළපස, පාචීනදේස, දක්ඛිණ දේශ යනු එම පළාත් හතරයි. මෙම පළාත් පාලනය සඳහා ඇපා හෙවත් ආදිපාද යන කුමාරවරු හෝ ඇමතිවරු පත්කරනු ලැබූහ. වළගම්බා රජුගේ සමයේ දී දකුණුපස පාලකයා වූයේ සංඝ නැමති අමාත්‍යවරයෙකි. වසභ රජුගේ පාලන සමයේ දී උත්තරපස්සයේ නාගදීපය පාලනය

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

කරනු ලැබුවේ ඉසිගිරිය නම් අමාත්‍යවරයෙකු විසින් බව වල්ලිපුරම් රන් සන්නසෙහි දැක්වේ.
අනුරාධපුර යුගයේ දී දක්ඛිණ දේශය හෝ රෝහණය බොහෝ විට උපරජු විසින් පාලනය කරනු ලැබිණි. කෙසේ වෙතත් ඇතැම් මූලාශ්‍ර මඟින් උපරජු වෙනුවෙන් අමාත්‍යවරුන් සහ කුමාරවරු විසින් ද රෝහණ ප්‍රදේශය පාලනය කිරීම ද දක්නට ලැබේ. තිස්සමහාරාමයෙන් ලද ක්‍රි.ව. පළමුවන සියවසට අයත්වන ටැම්ලිපියක භාතික අභය නම් කුමරකු ගැන සඳහන්ව ඇති අතර එහි එම කාලයට අයත් ටැම්ලිපියක මහගමහි යනුවෙන් හඳුන්වනු ලැබූ බදව ඇමතියෙකු පිළිබඳ සඳහන්ව ඇත.

අනුරාධපුර යුගයේ පැවති ප්‍රාදේශීය පරිපාලනයේ කුඩාම ඒකකය ගම විය. ක්‍රි. පූ. සියවස්වල ගමික වශයෙන් හැඳින්වුණු 'ගම්පති' නිලය අනුරාධපුර රාජධානියේ පසු භාගය වනවිට ගම්ලද්දා වශයෙන් හැඳින් වූ බව අභිලේඛනවලින් හෙළි වේ. ස්වකීය ප්‍රදේශයේ ආදායම් පාලනය, අධිකරණ සමතය ආදී සෑම කටයුත්තකදී ම මෙම නිලධාරීන් වගකිව යුතු විය. මිහිඳු රජතුමාගේ බදුලු ටැම්ලිපිය මීට නිදසුන්ය. ඒ අනුව 'ගම්ලද්' නායකයා වෙළෙඳපොළට පැමිණි විට පූර්ව චාරිත්‍රයන් අනුව පඬුරු විසිපහ ගත යුතුය.

පාලන පහසුව තකා අතීතයේ දී දසගම්, පස්ගම්(ගම් පහ) අටබාග යනුවෙන් කොටස් කර පාලනය කළ බව වේවැල්කැටිය ලිපියේ දීර්ඝව විස්තර කොට ඇත. දසගමට් /එකෙක -නායකයන් කිබිගම් (Epigraphia Zelanica 1928: Vol. I, 141).

බදුලු ටැම්ලිපියේ මෙවැනි පාලන නිලධාරීන් අට දෙනෙකු ගැන සඳහන් වේ. මේ අනුව විධිමත් පාලනයක් ගෙනයාම සඳහා පස්දෙනා, හයදෙනා, අටදෙනා ලෙස බෙදී මණ්ඩල වශයෙන් ක්‍රියා කළයුතු බවත් රජයෙන් එවැනි මණ්ඩල ක්‍රියාත්මක කළ බවත් අනාවරණය වේ (ශිලා ලේඛණ සංග්‍රහය 2001: ප්‍රථම වෙළුම, 72).

**3. යුධ කටයුතු සහ අධිකරණ සංවිධානය**

ලෝකය පවතින්නේ දණ්ඩ නීතිය මතය. එම නිසා රජු උත්සාහවන්තව දණ්ඩනය ක්‍රියාත්මක කළ යුතුය. නමුත් මේ මතයෙන් විනිර්මුක්ත වන කෞටිල්‍ය සත්ත්වයන්ට තියුණු දඬුවම් දීමෙන් උද්වේගයට පත්වන බවත් මෘදු දඬුවම් දීමෙන් රජු අවමානයට පත්වෙන බවත්ය.

දිවයිනේ සෑම පාලන කටයුත්තක දී මෙන් ම අධිකරණ පාලන කටයුතුවල දී ප්‍රධානියා වශයෙන් ක්‍රියා කළේ රජතුමාය. යුක්තිය පසිඳලීම රජුගෙන් ඉටුවිය යුතු වූ ප්‍රධාන කාර්යයක් බැවින් සතර අගතියෙන් තොරව අපක්ෂපාතීව එය ඉටුකිරීම සඳහා රජුට එයට අදාළ නීති රීති පිළිබඳ ව මනා දැනුමක් ලබා සිටිය යුතුය. රජ්ජුරුවන් නම් කාරණා කාරණ පරීක්ෂා කොට තරාදියක් මෙන් මධ්‍යස්ථව වන්නට වන්නේය.

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

රජු විසින් යම් වරදක් කළාහු ට නිග්‍රහ කරතත් පරීක්ෂා කොට දුරදිග බලා කළ වැරැද්දට නිසි නිග්‍රහ කරන්නේය. අපරීක්ෂාකාරීව කිපි සිතට නිග්‍රහ යෙදිය යුතු නොවෙයි යනුවෙන් පන්සියපනස් ජාතක පොතේ සඳහන් වේ. දිවයිනේ ඉපැරණි රජවරුන් අධිකරණය හා පරිපාලනය සම්බන්ධ නීති රීති කෙරෙහි මනා දැනුමක් ඇතිව කටයුතු කළ බවට තොරතුරු මහාවංශයේ සඳහන් වේ. වෝහාරිකතිස්ස රජු අධිකරණ ව්‍යවහාරයෙහි හෙවත් ධර්ම ව්‍යවහාරයෙහි පණ්ඩිතයෙකු ව දක්ෂයෙක් ව සිටි බව වංසකථාවේ සඳහන් වේ.

මෙරට නොයෙක් ස්ථානවල ස්ථාපිත කර තිබූ ප්‍රාදේශීක අධිකරණ ශාලා පිළිබඳ ව තොරතුරු රැසක් මූලාශ්‍ර මඟින් අනාවරණය කරගත හැකිය. එළාර රජු පරාජය කොට අනුරාධපුර රාජධානිය එක්සත් කළ දුටුගැමුණු රජතුමා අනුරාධපුරයේ රාජ්‍යයත්වයට පත්වීමෙන් අනතුරුව හැමතැන්හි ම මැදිහත් ව පැමිණ අධිකරණ විචාරණයේ නියෝග කොට අධිකරණ ශාලා කර වූ බව සිංහල ථූපවංසයෙහි දැක්වේ. පළමුවන ගජබාහු රජුගේ කාලයේ දී රුහුණු රටැ දුබලයහටි ගම හා අකුජු මහගම නමින් හැඳින්වුණු ගම් දෙකක පිහිටා තිබුණු මහා විනිශ්චය ශාලා දෙකක් ගැන සිතුල්පව්වෙන් ලැබුණු සෙල්ලිපියක සඳහන් වී ඇත (මේධානන්ද 2013: 68). මේ ලිපියට අනුව යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීමට ප්‍රධාන විනිශ්චය ශාලා මෙන් ම කුඩා විනිශ්චය ශාලා ද පවතින්නට ඇතැයි සිතිය හැකිය. ක්‍රි. ව. දහවන සියවසට අයත් වේවැල්කැටිය පුවරු ලිපියෙහි (Inscription of Ceylon 1963: vol. V part II,173-182). උතුර්පසැ අම්ගම් කුළියෙහි දසගමෙකැ පිහිටුවා තිබූ උසාවියක් පිළිබඳ තොරතුරු සඳහන් වේ. සිව්වන උදය රජුගේ රාජ්‍ය කාලයට අයත් මෙම ලිපියේ පිටපත් කහටගස්දිගිලිය, අනුරාධපුරය, වෙස්සගිරිය, මලුවෙයාය, වන්නඩිපාලම, කුරුම්පුලියන්කුළම, මීහොඳවැව, කොට්ටපිටිය, සේරුවිල සෝමපුරල ඉලක්කට්ටුඑබ, හිඟුරක්ගොඩ, දොඹගයවෙල ආදී වූ තවත් ස්ථාන දොළසකින් පමණ සොයාගෙන ඇති හෙයින් ද ඒ ලිපිවල සඳහන්ව ඇත්තේ ඒ ඒ පෙදෙස්වල දසගම්වල පිහිටුවා තිබුණු උසාවි පිළිබඳව හෙයින් එකල ලංකාවේ පිහිටා තිබූ සෑම දසගමකම මෙවැනි උසාවි පිහිටුවා තිබුණැයි සිතිය හැකිය. මේ අනුව තමන්ට පමණක් තනිවම තම විජිතයේ සෑම ගමකම, නගරයකම හෝ ජනපදයකම යුක්තිය පසිඳලීමට රජු අපොහොසත් වූ බැවින් තමන්ගේ මහාධිකරණ ශාලාවට අමතරව තම විජිතයෙහි නොයෙක් ස්ථානවල අධිකරණ ශාලා පිහිටුවා විනිශ්චයකරුවන් පත් කොට අනාහාස නිවාරණය කිරීමට රජුට සිදුවූ බව පැහැදිලිය.

අනුරාධපුර යුගයේ අවසාන භාගයේ සිට රජුට පැවරී තිබූ නොයෙක් පරිපාලන කටයුතු අධික වීම නිසා රජු තමාගේ අධිකරණ බලතලවලින් කොටසක් විනිශ්චය අමාත්‍යයෙකුට පවරා ඔහු ප්‍රාදේශීය විනිශ්චයකරුවන්ගේ නායකයා වශයෙන් පත්කරන්නට ඇතැයි මේ අනුව අපට සිතා ගත හැකිය. ක්‍රි.පූ තෙවන සියවසේ සිට ක්‍රි. ව. දහවන සියවස තෙක් හමු වී ඇති අභිලේඛන පිරික්සීමේ දී නීතිමය කටයුතු හා සම්බන්ධව ක්‍රියාකළ නිලධාරීන් හා නිලධර මණ්ඩල රැසක් හමු වේ. මන්ද්‍රඩීන්-

People's Journal Sri Lanka
ISSN 3121-3049
Volume 01, Issue 01

වර්ණග්‍රාමන් (Epigraphia Zelanica 1955: Vol.V,189). ග්‍රාමන් පිරිවහන්නා, ගම් වැසියන් පස්දෙනා, ගම් ලද්දන්, ගම්ලද් නායකයන්, පදිලද් දඩ නායකයන්, අඩවිය අට දෙනා, වෙල්යුත් පස්දෙනා, දසගම් ඇත්තන්, පියෝවදාරන්නන්, දණ්ඩනායක ආදීන් ඒ අතර ප්‍රධානය.

## 4. සමාලෝචනය

පුරාණ ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්‍රමෝපායක අවශ්‍යතාවය මත රණකාමී නායකත්වයක් බිහි වුව ද එය රාජ්‍යත්වයෙහි ප්‍රභවය වශයෙන් සැලකීමට නො හැකිය. මෙකී රණකාමී නායකත්වය රාජ්‍යත්වය තෙක් වර්ධනීය තත්ත්වයක් පූරණය කරගනු ලැබූයේ ක්‍රි. පූ. තෙවන සියවසේ දේවානම්පියතිස්ස රජ දවස ප්‍රබල අධිරාජ්‍යයෙක් වන අශෝක රජු සමග පැවති මිත්‍ර සබඳතාවෙනි.

පූර්වෝක්ත මිත්‍ර සබඳතාව අධ්‍යයනය කරලීමේ දී පැහැදිලි වනුයේ දේවානම්පියතිස්ස රජ සමයේ ඉන්දියාවේ අශෝක අධිරාජයාගේ අනුග්‍රහය හරහා ගොඩනැගුණු ලාංකීය රජ පදවිය ලැබීමේ ක්‍රමවේදය සහ දේශපාලනික තනතුරු ඒ ආශ්‍රිත ව ගොඩනැගුණු පරිපාලන රටාව පැරණි පෙරදිග රාජ්‍යයන්හි ප්‍රචලිත වූ ක්‍රමෝපාය ඇසුරින් ම නිර්මාණය වූවක් බවයි. දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකයේ දී ප්‍රභවය වූ හින්දු ආගමික බලපෑම්වලින් මිදී බෞද්ධ ආගමික ලක්ෂණ සමඟ මුසුවෙමින් ඉදිරියට ගමන් කළ අතර පරිපාලන ක්ෂේත්‍රයේ පෙර නොවූ විරූ ආකාරයේ නිලතල හා වගකීම් සමුදායක් සහිත ව විධිමත් රාජ්‍ය පාලන ක්‍රමවේදයක් සකස් වී ඇති බව අනාවරණය වුණි. මෙසේ පෙරදිග දේශපාලන න්‍යාය ධර්ම සාධනීය ලෙස භාවිතය මගින් තිරසාර දේශපාලන ප්‍රවර්ධනයට දායක කරගත හැකිය.

## 5. පරිශීලන ග්‍රන්ථ නාමාවලිය

අමරවංශ, කේ. (2017). *ලක්දිව සෙල්ලිපි,* කොළඹ: ඇස් ගොඩගේ.

ආටිගල, එන්., ලැබ්රෝයි ඩබ්ලිව්. ජේ. එෆ්. නඩේසන්, එස්. නිකලස් සී. ඩබ්ලිව්. පරණවිතාන. එස්, (1964). *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය ප්‍රථම භාගය,* විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

බෂාම්, ඒ. එල්. (1962) *අසිරිමත් ඉන්දියාව,* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

කරුණාගොඩ, කේ. (2012) *සම්මෝහ විනෝදනී විභංගට්ඨ කථාව,* දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන.

*පන්සිය පනස් ජාතක පොත් වහන්සේ*, (2005) කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

දිසානායක. එස්. (2009/11/12) *රජුන් හා සෙන්පතිවරුන් අතර බල ගැටුමේ පුරාණය*, දිවයින පුවත්පත.
දිවාකර, ඒ. ඊ. (2007) *අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි අභිලේඛන ඇසුරින් කෙරෙන ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය*, කොළඹ: චතුර මුද්‍රණාලය.
ප්‍රනාන්දු, එස්. (2015) *බුදු සමයේ දේශපාලන චින්තනය*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
බණ්ඩාර, ආර්. ඒ. ඩබ්. එම්. ආර්. (2007 /12/05 ) *ශ්‍රී ලංකාවේ ඉපැරණි වෙළෙඳාම සහ තීරුබදු*, දිවයින පුවත්පත.
බුද්ධදත්ත, පී. (සංස්) (1959) *සහස්සවත්ථුප්පකරණය*, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ: බී. සී. සී ප්‍රින්ටින් ප්‍රෙස්.
මිල්ලගහතැන්න, සී. එච්. (2009/06/03) *උමන්දාව බ්‍රාහ්මණ කුලයේ පැරදීම ගැන කතාවක් ද*, දිවයින පුවත්පත.
මේධානන්ද, එච්. (2013) *ඓතිහාසික සිතුල්පව්ව*, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.
ලියනගමගේ, ඒ. ගුණවර්ධන. ආර්. (1965) *අනුරාධපුර යුගය*, කොළඹ: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය.
විමලසේන, එන්. ඒ. (2007) *සම්භාෂා 15 වැනි කලාපය*, කොළඹ: අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව.
විමලකීර්ති. එම්. යූ. (1956) *සිංහල ආණ්ඩුව*, කොළඹ: මරදාන අනුල මුද්‍රණාලය.
වීරවර්ධන, වී. (2009/03/25) *අශෝක රජු එවූයේ අභිෂේක භාණ්ඩය*, දිවයින පුවත්පත.
*ශ්‍රී ලංකාවේ ඉතිහාසය ප්‍රථම කොටස අනුරාධපුර යුගය*, (2016). කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
සුරවීර, ඒ. වී. (1965) *අනුරාධපුර සමාජය*, කොළඹ: සොම්සඳ මුද්‍රණාලය.
සෝමතිලක, එම්. (2017) *ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි ඉන්දියානු සාධකය*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
හේරත්. එච්. එම්. එස්. බී, (2011) *සබරගමු විශ්ව විද්‍යාලීය ශාස්ත්‍රිය සංග්‍රහය*, සබරගමු විශ්වවිද්‍යාලය.
Dharma, P. C. (1941). *The Ramayana Polity*, Madras: Law Journal Policy.
Hettiarachchy. T. (1972) *History of Kingship in Ceylon up to the fourth century*, Colombo: Lake House Investment LTD.
Law, N. N. (1921). Aspects *of Ancient Indian Polity*, Oxford, Clarendon Press.
Mendis. G. C. (1945). *Early History of Ceylon,* Calcutta, Y. M. C. A. Pub. Publishing House.

ISSN 3121-3049
People's Journal Sri Lanka
Volume 01, Issue 01

Paranavitana, S. (1944). *Epigraphia Zeylanica. Vol. iv*, Colombo:, Department of Archaeology.

Paranavithana, S. (1970). *Inscriptions of Ceylon. Vol. I*, Edited, Colombo: Department of Archaeology.

Paranavithana, S. (1983). *Inscriptions of Ceylon, Vol. II, Part I*, Colombo: Department of Archaeology.

Paranavithana, S. (1955). *Inscription of Ceylon, Vol. V, Part I*, Colombo: Department of Archaeology.

Wickramasingha, D. M. De Silva, (1912) *Epigraphical Zeylanica. Vol. I*, London:, Oxford University Press.

Wickramasingha, D. M. De Silva, (1928) *Epigraphia Zeylanica. Vol. I,* Colombo: Department of Archaeology.

Wickramasingha, D. M. De Silva, (1912) *Epigraphical Zeylanica. Vol. I*, Colombo: Department of Archaeology.